09 APR 2018
කළමනාකරණ අංශය

1251

මගේ අංකය :- 28/03/02,
නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය,
පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරය,
නවනගරය,
පොළොන්නරුව.
2018.02.15.

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත.

## 2018 පෙබරවාරි මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව හා 2018 යල පෙර කන්න රැස්වීම් වාර්තාව 2018.02.15

<u>සහභාගී වූ රාජ්‍ය නිළධාරීන්</u>

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ඩබ්.ඒ.එම්.ජී. බණ්ඩාර | නේවාසික ව්‍යාපෘති කළමනාකරු |
| 02 | ඒ.ආර්.එන්.කේ.අලහකෝන් | ප්‍රාදේශීය නිළධාරී නවනගරය |
| 03 | කේ.එම්.එස්.පී.සෙනෙවිරත්න | මූලස්ථාන කෘෂිකර්ම උපදේශක සේවාගම |
| 04 | අයි.අයි.පී.කේ.අමරසූරිය | මූලස්ථාන කෘෂිකර්ම උපදේශක නවනගරය |
| 05 | නදීකා සංජීවනී ජයසිංහ | ක්ෂේත්‍ර නිළධාරී කෘෂි රක්ෂණ මණ්ඩලය |
| 06 | ඩබ්.ඒ.ඒ.ඩී.වර්ණසිංහ | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| 07 | ජී.එම්.එන්.එම්.ගිරාකඩුව | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| 08 | ඩී.එම්.කේ රංජන් දේවගිරි | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| 09 | ජී.බී.ජී.නිමල් ප්‍රේමරත්න | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| 10 | එස්.ඩී.ස්වර්ණලතා | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| 11 | ඩබ්.ඒ.සරෝජා වික්‍රම ආරච්චි | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර |
| 12 | කේ.ඩී.ආර්.එස්.කාන්ති | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර |
| 13 | ජී.ජී.මුණවීර | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර |
| 14 | ඩබ්.එම්.සිසිර කුමාර | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර |
| 15 | එම්.ජී.ගුණරත්න | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර |
| 16 | එම්.ජයන්ති ආරියවංශ | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර |
| 17 | ඩබ්.එම්.චමාලි සඳරේඛා | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර |

<u>සහභාගී වූ ගොවි සංවිධාන නිළධාරීන්</u>

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | එච්.එම්.කරුණාරත්න | ගරු සභාපති | වීර පෙදෙස |
| 02 | එච්.බී. ජයවර්ධන | ගරු සභාපති | 2 ඇල වීර පරාක්‍රම |
| 03 | ඩබ්. ජගත් අරුණ කීර්ති | ගරු සභාපති | D3 උතුර |
| 04 | ඩී. සුමනදාස | ගරු සභාපති | සේවාගම |
| 05 | ආර්.ජී. පොඩි අප්පුහාමි | ගරු සභාපති | සිංහරාජපුර |
| 06 | අයි.එම්. ටිකිරි බංඩා | ගරු සභාපති | මොණරතැන්න |
| 07 | එන්.එම්.ඒකනායක | ගරු සභාපති | අඹන්ගඟ |
| 08 | කේ.එම්.සාලි | ගරු සභාපති | මුස්ලිම් ජනපදය |
| 09 | ඒ.ජී.රම්බණ්ඩා | ගරු සභාපති | ඩී 02 නැගෙනහිර |
| 10 | ඒ.ඒ.සුමතිපාල | ගරු සභාපති | කලහගල |
| 11 | කේ.මිල්ටන් | ගරු සභාපති | ලක්ෂ උයන |

| | | | |
|---|---|---|---|
| 12 | ටී.ජී.ගාමිණී රණබාහු | ගරු සභාපති | කැගල්ගම |
| 13 | බී.එස්.තිලකරත්න | ගරු සභාපති | සිංහපුර |
| 14 | එල්.සී.නවරත්න | ගරු සභාපති | 4 ඇල මැදගම |
| 15 | ඩබ්.ආරියපාල | ගරු සභාපති | ගැමුණු පරාක්‍රම |
| 16 | අයි.එම්.ටිකිරි බණ්ඩා | ගරු සභාපති | මොණරකැන්න |
| 17 | අයි.එල්.කේ.මොහිදීන් | ගරු සභාපති | සූංගාවිල |
| 18 | අයි.එම්.ජී.නවරත්න | ගරු සභාපති | කාලිංග ඇල |
| 19 | එස්.එම්.ඒ.රහීම් | ගරු සභාපති | වීරපුර |
| 20 | ඩී.ජී.ලලිත් ප්‍රියදර්ශන | ගරු සභාපති | ගැමුණුපුර |
| 21 | ඩබ්.එම්.ජී.එස්.බණ්ඩාර | ගරු උප සභාපති | ලංකාපුර |
| 22 | එච්.එම්.සමරවීර | ගරු ලේකම් | මහසෙන් දෙබරැල්ල |
| 23 | ඩබ්.එම්.රොබින් සමරනායක | ගරු ලේකම් | කලහගල |
| 24 | එස්.ඩබ්.ආර්.එම්.මුතු බංඩා | ගරු ලේකම් | වෙහෙරගොඩැල්ල |
| 25 | එම්.පී.චන්ද්‍රසෝම | ගරු ලේකම් | ගැමුණු පරාක්‍රම |
| 26 | ජේ.ඒ.ජයසූරිය | ගරු ලේකම් | දමන ගැමුණුපුර |
| 27 | ජේ.එම්.වීරසේන | ගරු භාන්ඩාගාරික | විජයරාජපුර |
| 28 | ජී.එම්.සේනක අලගිය වත්ත | ගරු භාන්ඩාගාරික | කලහගල |
| 29 | ඒ.ජී.ජයරත්න | ගරු භාන්ඩාගාරික | වෙහෙරගොඩැල්ල |

ආගම සිහිකිරීමෙන් පසු නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමා විසින් පැමිණ සිටි රාජ්‍ය නිළධාරීන් හා ගොවි සංවිධාන නිළධාරීන් පිළිගැනීමෙන් අනතුරුව ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

<u>ලිපි ඉදිරිපත් කිරීම.</u>

වීරපෙදෙස ගරු සභාපතිතුමාගේ බිරිඳගේ අවමංගල්‍යයට සහභාගී වූ සියළුම දෙනාට ස්තූති කර ඉදිරිපත් කල ලිපිය ඉදිරිපත් කරන ලදී.
සිංහරාජපුර බෙදුම් ඇල ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ගොඩ ඉඩමක් සඳහා අනවසරයෙන් කපා ඇති ඇල නිසා අවට ඉඩම් හිමියන්ට ඇති වී ඇති ගැටළුව නිරාකරණය කර දෙන ලෙස ඉල්ලා තිබූ ලිපිය ඉදිරිපත් කරන ලදී. එම ස්ථානය පරික්ෂා කර බැලීමට තීරණය කරන ලදී.

<u>ආයතන සංවර්ධන කටයුතු</u>

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාලය |
|---|---|---|---|---|
| නේවාසික ව්‍යාපෘති කළමනාකරු | ගොවි සංවිධාන ශක්තිමත් භාවය මැනීම සඳහා පොත්පත් ලබා දී ඇති උපදෙස් අනුව පවත්වාගෙන යන ලෙසත් ප්‍රධාන කාර්යාලයෙන් මෙම මස 26 හා 27 දින ගොවි සංවිධාන පොත් පත් පරික්ෂා කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇති බැවින් ඒ සඳහා සහයෝගය දක්වන ලෙසත් ඉල්ලා සිටින ලදී.ගොවි සංවිධාන නිළවරණ එකම කාලයක පැවැත්විය යුතු බවත් ඉන්පසු ඒකාබද්ධ ගොවි,සංවිධානයේ නිළවරණය පැවැත්විය හැකි බවද දන්වන ලදී. | | | |
| සංවර්ධන සහකාර | ගොවි සංවිධාන මුදල් භාරංග නිසි කලට ලබා දෙන ලෙසත් මාර්තු 31 ට පෙර සියළුම ගොවි සංවිධාන විගණනය කර අවසන් කල යුතු බැවින් ඒ සඳහා සහාය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. | | | |

<u>මෙහෙයුම් නඩත්තු කටයුතු</u>



| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | තීරණය ක්‍රියාත්මක කිරිම සදහා ගතවන කාලය |
|---|---|---|---|---|
| නේවාසික ව්‍යාපෘති කළමනාකරු | අද දින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග ඉංජිනේරුතුමා ඇතුළු ඉංජිනේරු සහකාර නිළධාරින් හට ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දැනුම් දුන් බවත් වැවේ ජල ධාරිතාවය අක්කර අඩි 113500 ක් ඇති බැවින් 2018 යල කන්නය සදහා පෙර කන්න තීරණ ගැනීම සුදුසු බවත් වාරිමාර්ග ඉංජිනේරුතුමා තමා හට දුරකතනයෙන් දැනුම් දුන් බව පැවසීය. ඒ අනුව 2018 යල කන්නය සදහා පෙර කන්න රැස්වීම පවත්වන බවද දැනුම් දෙන ලදි. | | | |

<u>කෘෂිකර්ම සංවර්ධන කටයුතු</u>

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | තීරණය ක්‍රියාත්මක කිරිමට ගතවන කාලය |
|---|---|---|---|---|
| මූලස්ථාන කෘෂිකර්ම උපදේශක සේවාගම | වී වගාව හීන් බණ්ඩි හෝ රට ඉහල අවස්ථාවක තිබෙන මේ අවස්ථාවේ දිලිර හානි ,දුඹුරු පුල්ලි,කොපු අංගමාරය වැනි හානි දක්නට ඇති බවත් දිලිර හානි සදහා දිලිර නාශක යෙදිය යුතු බවත් වගා ක්ෂේත්‍රයේ ජල මට්ටම අඟල් 1 ක් 2ක් මට්ටමක තබා ගන්නා ලෙසත් ගොයම් ගසේ වැඩිපුර කොළ පාට තිබේනම් යූරියා පොහොර නොයොදන ලෙසත් දන්වන ලදි. මේ පවතින පරිසර තත්වයත් දිලිර හානියට බලපා ඇති බවත් කීඩෑ හානිය පැතිරිය හැකි බවත් දැනට කීඩෑ හානිය නිරික්ෂණය වී නොමැති බවත් කෘමිනාශක යෙදීමට පෙර කීඩෑ හානිය තිබේදැයි වගා ක්ෂේත්‍රය හොදින් පරික්ෂා කර බලන ලෙසත් දන්වන ලදි.වගාවේ හැම රෝගයක්ම දිලිර නාශක හා කෘමිනාශක වලින් වැලැක්විය නොහැකි බැවින් ගොවින් දැනුවත් කිරිම සදහා පවත්වන භෝග සායන වැඩසටහන් සදහා ගොවින් යොමු කරවන ලෙසත් දන්වන ලදි.<br>ගොවි කාන්තා සමිති සදහා බදුන් පැල සිටුවීම සදහා බදුන් ලබා දී ඇති බවත් ඉත්තල බීජ ලබා දීමට බලාපොරොත්තු වන බවත් පැවසීය. | | | |

| | | | | |
|---|---|---|---|---|
| | 50% දායකත්වය යටතේ මී මැසි පෙට්ටි,මුහුණු වැස්ම හා අවශ්‍ය උපකරණ ලබා දෙන බව පැවසීය.<br><br>කෘෂිකාර්මික නවාකරණ වැඩසටහන යටතේ අක්ක ¼ ට ½ ට වැඩි බිම් ප්‍රමාණයක මැගි බෝග හා මිරිස් බෝග වගා කරන ගොවීන්ට නොමිලයේ හෝ 25% ක මුදලක් අය කර හෝ කොන්ක්‍රීට් කණු,බට,වතුර පොම්ප ලබා දෙන බව පැවසීය.<br>පිබිදෙමු පොළොන්නරුව යටතේ 50% දායකත්වය යටතේ අඟල් 2 හෝස් පවර් 03 වතුර පොම්ප ලබා දෙන බවත් ඒ සඳහා ඉල්ලුම් කරන ලෙසත් දන්වන ලදී.<br><br>තණකොළ කපන යන්ත්‍ර ලැබී ඇති බවත් මුදල් බැඳ ඇති අයට යන්ත්‍ර ලබාගත හැකි බව පැවසීය.දෙවන අදියර යටතේ තණකොළ කපන යන්ත්‍ර අවශ්‍ය අයට ලබා ගත හැකි බවත් ඒ සඳහා ජනාධිපති කාර්යාලය හරහා ප්‍රතිපාදන ලබා දෙන බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවීන් තෝරන බවත් පැවසීය. | | | |
| ගරු සභාපති හේමරත්න | කෘෂිකර්ම උපදේශක නිළධාරීන් යටතේ තණකොළ කපන යන්ත්‍ර ලබා නොදුන් බවත් ඒ සඳහා වෙනත් ක්‍රමයක් ක්‍රියාත්මක වූ බවත් කෘෂිකර්ම උපදේශක නිළධාරින්ගේ නිර්දේශය මත ලබා දෙනවානම් සුදුසු බව පැවසීය. | | | |
| මූලස්ථාන කෘෂිකර්ම උපදේශක සේවාගම | තණකොළ කපන යන්ත්‍ර ලබා දීම සඳහා ගොවීන් තෝරාගැනීමේදී කොම්පෝස්ට් සකස් කිරීම,කිරි ගවයින් ඇති කිරීම හා බිත්තර වී වගා කිරීම යන නිර්නායක භාවිතා කල බව පැවසීය.<br>කාරක සභා රැස්වීම් සඳහා සහභාගී වීමට ගොවි සංවිධාන කාරක සභා දැනුම් දෙන ලෙසත් දන්වන ලදී. | | | |
| ගරු සභාපති සිංහපුර ගොවි සංවිධානය | භෝග සායන වැඩසටහන් දෙකක් කල බව පැවසීය. | | | |
| ගරු සභාපති ඩී 03 උතුර | දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවට සහභාගී වූ ජනාධිපති ලේකම් වරයෙකු දැනුම් දුන් පරිදි 2018 වර්ෂයේදී තණකොළ කපන යන්ත්‍ර ,වායු රයිපල් වැනි දේ සඳහා මුදල් වෙන් කර ඇති බව පැවසීය. | | | |

| | | | | |
|---|---|---|---|---|
| මුලස්ථාන කෘෂිකර්ම උපදේශක නවනගරය | තණකොළ කපන යන්ත්‍ර බෙදා දීම අදියර 4කින් ක්‍රියාත්මක වූ බවත් කෘෂිකර්ම උපදේශක වරයෙකුට යන්ත්‍ර 30 ක් ලැබුන බවත් එය ගොවින් තෝරා බෙදා දුන් බවත් පැවසීය. ක්‍රියාත්මක වූ අදියර 2 සඳහාම මුදල් බැන්දේ කෘෂිකර්ම කාර්යාලයට බවත් පැවසීය.<br>4 අල මැදගම ග්‍රාම නිළධාරි වසම් 2ක භෝග සායන වැඩසටහනක් පෙබරවාරි 20 දිනත් පරාක්‍රම සමුද්‍රය හා අඹන්ගඟ බෝග සායන වැඩසටහන පෙබරවාරි 22 දිනත් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව පැවසීය. ඊට අමතරව කෙත් ඇළ මට්ටමින් ගොවින්ට උපදෙස් ලබා දෙන බවත් පැවසීය.<br>4 ඇලේ කාබනික පොහොර පමණක් යොදා වී වගා කරන වර්ග මීටර් 100 ආදර්ශණ 5ක් ඇති බව පැවසීය. | | | |
| ගරු සභාපති ඩී 03 උතුර | විදුලි වතුර පොම්පයේ මිල වෙළඳපලේ විදුලි වතුර පොම්පවල මිලට වඩා වැඩි බව පැවසීය. | | | |
| මුලස්ථාන කෘෂිකර්ම උපදේශක නවනගරය | වෙළඳපලේ මිලට වඩා මිල වැඩි බව දැනුවත් කල බවත් ලබා දෙන වතුර පොම්පය වෙළඳ පලේ වතුර ටැංකියට වඩා හොඳ තත්වයේ වතුර පොම්ප බව දැනගන්නට ලැබුන බව පැවසීය. | | | |
| ගරු සභාපති ඩී 03 උතුර ගොවි සංවිධානය | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව දැනුවත් කල යුතු බව පැවසීය.වසර 5ක වගකීමක් ඇති සිංගර් වතුර පොම්පය රුපියල් 28000/= කට මිලදී ගැනීමට හැකි බවද දන්වන ලදි. | | | |
| ගරු සභාපති කැගළුගම | සළබයාගේ හානිය වර්ධනය වෙමින් පවතින බවත් අවධි 03 කදී හානිය වර්ධනය වන බවත් පැවසීය. තවද මුං වගාවේ කහ කොඩ රෝගය වර්ධනය වෙමින් පවතින බවත් පැවසීය. | | | |
| කෘෂිකර්ම උපදේශක සෙව්ගම | ස්ථාන 10 ක් පමණ පරික්ෂා කර බලා ස්ථාන 7 ක 8ක පනුවෝ ඉන්නවානම් කෘමිනාශක යොදන ලෙසත් එසේ නොමැති නම් කෘමිනාශක අවශ්‍ය නොවන බවත් දන්වන ලදී.<br>මුං ඇට වෛරස් එකක් විය හැකි බව පැවසීය. | | | |
| ගරු සභාපති මොණරතැන්න | අක්කර එකට පොහොර නිර්දේශය පිළිබඳව විමසන ලදි. | | | |
| කෘෂිකර්ම උපදේශක සෙව්ගම | යූරියා කි.ග්‍රෑ.90 ,ටී.එස්.පී.කි.ග්‍රෑ.22 එම්.ඕ.පීකි.ග්‍රෑ.24 මෙම නිර්දේශය වෙනස් වන බවත් පොහොර අඩු නම් පොහොර වැඩි කල යුතු බවත් පොහොර වැඩි නම් පොහොර අඩු කල යුතු බවත් පැවසීය. | | | |

**සේවා සැපයුම්**

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | තීරණය ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය |
|---|---|---|---|---|
| ප්‍රාදේශීය නිළධාරී නවනගරය | මධ්‍යස්ථානයේ පැවැත්වූ ශ්‍රමදානය සඳහා තෝප්පාවැව හා වීර පෙදෙස ගොවි සංවිධාන දෙක පමණක් සහභාගි වූ බවත් අනෙක් ගොවි සංවිධාන වලින්ද දෙදෙනෙකු සහභාගී කරවන ලෙස දන්වන ලදි.කාන්තා ගොවි සංවිධාන 53 ක් ලියාපදිංචි කර ඇති බවත් කාන්තා ගොවි සංවිධාන සඳහා පලතුරු පැල සහ බීජ පැකට් ලබා දී ඇති බවත් පැවසීය. පලතුරු ගම්මාන වැඩසටහන යටතේ වීරපෙදෙසට පැල 1000 ක් ලැබුන නමුත් වටපනු හානිය තිබූ බවත් මේ පැල සඳහා නැවත පැල ඉල්ලුම් කලත් පැල නොලැබුන බව පැවසීය. | | | |
| ගරු සභාපති සිංහරාජපුර | පසුගිය ව්‍යාපාර කමිටුවේ තමා විසින් පොහොර රුපියල් 2600/= ට අලෙවි කිරීම සම්බන්ධයෙන් කළ ප්‍රකාශය ඉවත් කර ගන්නා බවත් සේවාගම ප්‍රාදේශීය නිළධාරිතුමා පැහැදිලි කල ආකාරයට බෑමේ කුලී හා ප්‍රවාහන කුලී සඳහා මුදලක් අය කර ඇති බව දැන ගන්නට ලැබුන බව පැවසීය. | | | |
| ගරු ලේකම් දමන ගැමුණුපුර | මොණරතැන්න කාන්තා ගොවි සංවිධානයට ලැබුන පැල දමන ගැමුණුපුරටත්, ගල්කොරියටත් බෙදා දීමට සිදු වීම නිසා මොණරතැන්නට අසාධාරණයක් වූ බව පැවසීය. | | | |
| ගරු සභාපති මොණරතැන්න | එම පැල කාන්තා ගොවි සංවිධාන දෙකටම ලැබුන බවත් ඉතාම සාර්ථකව පැල බෙදා දුන් බවත් පැවසීය. | | | |
| කෘෂි රක්ෂණ මණ්ඩලය | වගා හානි වෙලා තියෙනවානම් 1918ට දැනුම් දෙන ලෙස දන්වන ලදි. | | | |

1994 අංක 13 දරණ වාරිමාර්ග ( සංශෝධිත ) පනතේ 05 වන වගන්තියේ 05 වන අනු වගන්තිය අනුව 2018 .02.15 දින පරාක්‍රම සමුද්‍රය නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේදී පැවති පෙර වගා රැස්වීමේදී පරාක්‍රම සමුද්‍රය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ **2018** යල කන්නය සඳහා යෝජිත වගා කාල සටහන

- වගා රැස්වීම සඳහා යෝජිත දිනය - **2018.03.22.**
- වගා කිරීමට අපේක්ෂිත භෝග වර්ග බෝග - මාස 3 , 3 ½ වී සහ වෙනත් ක්ෂේත්‍ර
- වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය - හෙක්. **10365**
- මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - **2018.04.20**
- මුර ජලය ආරම්භ කරන දිනය - **2018.05.11**
- අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - **2018.08.15**
- වගාව පිහිටුවා අවසන් කල යුතු දිනය - **2018.05.11**
- ගොවින් විසින් ඇලවේලි ශුද්ධ කර අවසන් කල යුතු දිනය - **2018.04.15**
- ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකරනු ලබන ඇලවල් ගොවි සංවිධානය විසින් ශුද්ධ කල යුතු දිනය - **2018.04.18**
- වගා රක්ෂණය අවසන් කල යුතු දිනය - **2018.05.11**
- වගාහානි දැනුම් දිය යුතු දිනය - **2018.08.15**
- අස්වනු නෙලා අවසන් කල යුතු දිනය - **2018.08.30**
- පොහොර සහනාධර ලබා දිය යුතු දිනය - **2018.04.20**

**1994 අංක 13 ( සංශෝධිත ) දරණ වාරිමාර්ග ආඥා පනත 11 වගන්තියෙහි 1 හා 2 උප වගන්ති අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති .**

I. කෙත් ඇලවල් සහ බෙදුම් ඇලවල් වල නඩත්තුව සඳහා අක්කර 01 කට රු 200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුයි .
II. නියමිත දිනට බෙදුම් ඇලවල් සහ කෙත් ඇලවල් වල තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් මීටරයකට රු 100 .00 ක මුදලක් අය කිරීම
III. පිදුරු පිළිස්සීම වෙනුවෙන් අක්කර 1 කට රු 10000.00 ක මුදලක් අය කරනු ඇත .
IV. ජලය නිකුත් කිරීම අවසන් කිරීමට යෝජිත දිනයෙන් පසු ජලය ඉල්ලීම වෙනුවෙන් හෙක්ටයාර් 01 කට රු 250 /= ක මුදලක් අය කිරීම .
V. වාරිමාර්ග නිර්මිත වලට හානි කිරීම සම්බන්ධයෙන් වාරිමාර්ග ආඥාපනතේ පනවා ඇති නීති අනුව කටයුතු කිරීම .

2018 යල කන්නය සඳහා ඉහත සඳහන් පෙර කන්න තීරණ සුදුසු බවට ඩී 03 උතුර බෙදුම් ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති ජගත් අරුණ කීර්ති මහතා විසින් යෝජනා කල අතර විර පෙදෙස ගරු සභාපති ඩබ්.එම්.කරුණාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

නේවාසික ව්‍යාපෘති කළමනාකාරතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 1.00 ට පමණ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

~~ඩබ්. ජේ. එම්. ජී. බණ්ඩාර~~
නේවාසික ව්‍යාපෘති කළමනාකරු
පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරය.

**ඩී. එම්. ඥානපාල**
**නේවාසික ව්‍යාපාර කළමණාකරු**
**වාරිමාර්ග කළමණාකරණ අංශය**
**පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය**
**නවනගරය - පොළොන්නරුව.**